# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2194/54 - 2020 සැප්තැම්බර් මස 23 වැනි බදාදා - 2020.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නාමල් රාජපක්ෂ (පා.ම),**
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2020 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1986.01.20 දිනැති හා අංක 385/7A දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග මගින් සංශෝධිත 1974 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 130 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1974 අංක 03 දරන ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගීවන්නන් පාලනය කිරීමේ නියෝග පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. 6 අ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන නියෝගවල "තේරීම් කමිටුව" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව" යන වචන ආදේශ විය යුතුය.

2. 6 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝග ඇතුළත් කිරීමෙන් ;

**6 (ඉ)**
සියලුම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි තේරීම් කමිටුව පත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවෙන් පමණක් සිදු විය යුතු අතර තේරීම් තරග පවත්වන දිනයන්, ස්ථානයන්, අදාළ විස්තර සහ


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තේරීම් නිර්ණායකයන් පිළිබඳ තොරතුරු දින 14කට ප්‍රථම ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත දැනුම් දිය යුතුය. එම සියලුම පිටපත් ලිඛිතව එදිනම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ද ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල තේරීම් තරග සහ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි සභාපති/ලේකම් හා පුහුණුකරුවන්ගේ පෞද්ගලික අභිමතය පරිදි පවත්වන ලද තේරීම් තරග සහ තෝරා ගැනීම් ද අහෝසි කිරීමේ බලය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව සතුය.

**6 (ඊ)**

සියලුම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන විසින් තේරීම් තරග පැවැත්වීමට දින 28කට පෙර තේරීම් නිර්ණායකයන් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර තේරීම් නිර්ණායක තම නිල වෙබ් අඩවියේ ද ක්‍රීඩා විෂයභාර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ද පළකළ යුතුය. එසේම තේරීම් තරග අවසානයේ තේරීම් තරග ප්‍රතිඵල තම නිල වෙබ් අඩවියේ පළකළ යුතු අතර තෝරාගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නිවැරදි නාම ලේඛනය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කළ යුතුය. මෙම තරග ප්‍රතිඵල සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් ඇත්නම් එම විරෝධතා සෘජුවම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ඉදිරිපත් කළ යුතුය. විරෝධතා සලකා බැලීමෙන් අනතුරුව ස්ථිර කරනු ලබන තරග ප්‍රතිඵල නාම ලේඛනය සියලුම අවශ්‍ය තොරතුරු සමග එදිනම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි නිල වෙබ් අඩවිවල පළකළ යුතුය.

**6 (උ)**

තේරීම් තරග පරීක්ෂණ (Selection Trials) සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ අදාළ ජාතික ක්‍රීඩාව භාර ව්‍යාපෘති නිලධාරියා සහභාගී කර ගත යුතු අතර ඒ පිළිබඳව ද ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව දැනුවත් කළ යුතුය.

**6 (ඌ)**

තේරීම් තරග පරීක්ෂණ අවසානයේ එදිනම හෝ පසු දින ලිඛිතව ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත පහත තොරතුරු ලබා දිය යුතුය.

(අ) ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි සභාපති හෝ ලේකම් විසින් සහතික කර තේරීම් තරග සඳහා සහභාගි වූ තේරීම් කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ අත්සන් නාම ලේඛනය.

(ආ) ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි තේරීම් කමිටු සාමාජිකයන්ගේ අත්සනින් යුතු තේරීම් තරග සඳහා සහභාගී වූ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නාම ලේඛනය.

(ඇ) ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි තේරීම් කමිටුව විසින් සහතික කළ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තේරීම් සිදුකළ ආකාරය සහ ඔවුන්ට ලකුණු ලබා දී ඇති ආකාරය පිළිබඳ ලකුණු සටහන් පත්‍රය.

(ඈ) තෝරා ගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉසව්, ස්ථාන සහ අතිරේක ක්‍රීඩක ක්‍රීඩිකාවන් ද ඇතුළුව ඔවුන්ගේ නිවැරදි නාම ලේඛනය.

**6 (එ)**

ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි තේරීම් තරග අවසානයේ ජාතික තේරීම් කමිටුව වෙත ලැබෙන සියලුම අභියාචනා/පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ/විමර්ශන සිදු කිරීමේ සහ නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව සතුය.

**6 (ඒ)**

සියලුම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි විධායක කමිටුවල සාමාජිකත්වයේ වෙනස්වීම් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ලිඛිතව දැනුවත් කළ යුතුය.

**6 (ඔ)**

ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද අදාළ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල තේරීම් කමිටුවලට පත්වීම් ලිපි ලබාදීමේ දී පිටපතක් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ලබා දිය යුතුය.

**6 (ඕ)**

ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් සියලුම ජාතික සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් සකස් කොට යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි සංචිතගත සියලු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා සහ ජීව දත්ත තොරතුරු ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත යොමු කළ යුතුය. ජාතික සංචිත නම් කිරීමෙන් පසු නවක ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇතුළත් කිරීම්/ඉවත් කිරීම් පිළිබඳ තොරතුරු ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ලබා දිය යුතුය.

**6 (ක)**

ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට පෙර කිසිදු ජාත්‍යන්තර තරගාවලියක් සඳහා නාම යෝජනා ලබා නොදිය යුතු අතර පුහුණුකරුවන්/කළමණාකරුවන්/සහායක පුහුණුකරුවන්/ක්‍රීඩා අභ්‍යාසක/සම්භාහකවරුන් එම ජාත්‍යන්තර තරගාවලි සඳහා නිර්දේශ කිරීමේ දී නිසි ක්‍රමවේදයක් ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන විසින් අනුගමනය කළ යුතු අතර ඊට පහත නිර්ණායක අනුව සකස් කර ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ එකඟතාවය ලබාගත යුතුය.

(අ) මේ දක්වා ක්‍රීඩා ක්ෂේත්‍රයට ලබා දී ඇති දායකත්වය,
(ආ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වත්මන් ක්‍රියාකාරීත්වය,
(ඇ) අදාළ ක්‍රීඩාව පිළිබඳ දැනුම, අවබෝධය සහ අත්දැකීම්,
(ඈ) ක්‍රීඩකයකු/පුහුණුකරුවකු ලෙස දක්වන ලද දක්ෂතා.

10 - 338

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.